චක්‍රලේඛ අංක : 2009/16

# අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන

අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය", බත්තරමුල්ල.

චක්‍රලේඛ අංක : 2009/16

මගේ අංකය : ඊඩී/01/12/06/15/01
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
“ඉසුරුපාය”, බත්තරමුල්ල.
2009.05.18

පළාත් අධ්‍යාපන ලේකම්වරු,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු
පාසල් ප්‍රධානීන් වෙත

## අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන

“විශ්ව විද්‍යාල ප්‍රවේශය පිළිබඳ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂය සංයෝජන” යනුවෙන් නිකුත් කරනු ලැබ ඇති 1998.04.09 දිනැති අංක 98/15 දරණ චක්‍රලේඛ හා එම චක්‍රලේඛයට කරන ලද යම් යම් සංශෝධන ඇතුළත්ව නිකුත් කරනු ලැබ ඇති 1998.11.24 දිනැති අංක ද්වි/ආ/103, 1999.08.19 දිනැති අංක 1999/31, 2001.03.23 දිනැති අංක 2001/9 , 2001.06.27 දිනැති අංක 2001/19 . 2004.02.27 දිනැති අංක 2004/11, 2005.03.03 දිනැති ඊඩී/01/12/03/10/01 සහ 2008.09.16 දිනැති අංක 2008/38 චක්‍රලේඛ සංශෝධනයන් අභිබවා මෙම චක්‍රලේඛය පහත සඳහන් පරිදි ක්‍රියාත්මක වේ.

**2.0** උසස් පෙළ විෂයයන් සඳහා නව විෂයය නිර්දේශය නිපුණතා පාදක නව විෂයමාලා දර්ශනයට අනුව 2009 වර්ෂයේ සිට හඳුන්වාදීමට නියමිත වන අතර, 2009 වර්ෂයේ සිට 12 වන ශ්‍රේණියට ඇතුළත් වන සිසුන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කරන ලද නව විෂයය නිර්දේශයට අනුව ඉගැන්විය යුතුය. මෙම නව විෂය නිර්දේශයට අනුව අ.පො.ස. (උසස් පෙළ) විභාගය ප්‍රථම වතාවට 2011 වර්ෂයේ දී පැවැත්වෙනු ඇත. 2008 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) පංතිවලට (12 වන ශ්‍රේණියට) ඇතුළත්ව ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ඊට පෙර ඇතුළත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් පැරණි විෂය නිර්දේශ යොදා ගත යුතුය. කෙසේ වුව ද පැරණි විෂය නිර්දේශ අනුව අ.පො.ස (උසස් පෙළ) විභාගය පැවැත්වෙන්නේ 2012 වසර දක්වා පමණි.

**3.0** 2009 වර්ෂයේ හා ඉන්පසුව 12 වන ශ්‍රේණියට ඇතුළත්වන සිසුන්ට මෙම චක්‍රලේඛයේ අඩංගු අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරාවන් සඳහා විෂය සංයෝජන හා ඒවා ක්‍රියාත්මක වන විධිවිධාන බල පැවැත්වේ.

**4.0** නව විෂයමාලාව යටතේ ද අ.පො.ස. (උසස් පෙළ) පංතිවල ප්‍රධාන විෂයයන් තුනක් ඉගැන්වෙන අතර එක් විෂයයක් සඳහා සතියකට කාලච්ඡේද 10 ක් වෙන් කෙරේ. ඒ අනුව එම නිර්දේශිත ප්‍රධාන විෂයයන් 3 සඳහා කාලච්ඡේද 30ක් වැය වේ. ඉතිරි කාලච්ඡේද 10 න් 6 ක් සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා වෙන් කළ යුතු අතර සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) විෂයය සඳහා 12 ශ්‍රේණියේ පමණක් කාලච්ඡේද 02 ක් වෙන් කළ යුතුය. 12 ශ්‍රේණියේ ඉතිරි කාලච්ඡේද 2 ද 13 වන ශ්‍රේණියේ ඉතිරි කාලච්ඡේද 04 ද පාසල් කළමනාකරණ කණ්ඩායමේ අභිමතය පරිදි සිසුන්ගේ අධ්‍යාපන දියුණුවට අදාළ වන ආකාරයෙන් යොදා ගත යුතු වේ.

**5.0** නියම කර ඇති මූලික අවශ්‍යතා සපුරා ඇති සිසුන් 13 වන ශ්‍රේණියේ අවසානයේ දී ප්‍රධාන විෂයයන් 03 සමඟ සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයන් සඳහා විභාගයට පෙනී සිටිය යුතුය. සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා ලබාගන්නා ලකුණු හෝ සාමාර්ථ්‍යය විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා උපයෝගී කරගනු නොලැබේ. එහෙත් එම විෂයය සඳහා ලබාගන්නා ප්‍රතිඵලය අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල සහතිකයේ සටහන් කෙරේ.

### 6.0 අ.පො.ස. (උසස් පෙළ) විෂයධාරාවන් සඳහා විෂයය සංයෝජන

පාසල්වල දැනට ක්‍රියාත්මක වන විෂයධාරා 04ක් සඳහා ශිෂ්‍යයන් විසින් තෝරා ගත යුතු විෂයය සංයෝජන පහත දැක්වේ.

### 6.1 කලා විෂයය ධාරාව

ශිෂ්‍යයන් කලා විෂයධාරාව යටතේ අධ්‍යාපනය ලැබීම සඳහා පහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව විෂය සංයෝජනයන් තෝරා ගත යුතුය.

**6.1.1** පහත දැක්වෙන සමාජීය විද්‍යාව/ ව්‍යවහාරික සමාජ අධ්‍යයන විෂය කාණ්ඩයෙන් (6.1.6 හි අ) අවම වශයෙන් එක් විෂයයක් තෝරාගත යුතුය. ( භාෂා විෂයයන් 2 ක් හෝ තුනම හෝ තෝරා ගන්නා සිසුන්ට මෙය අදාළ නොවේ) ශිෂ්‍යයාගේ මනාපය අනුව මේ කාණ්ඩයෙන් විෂයයන් 2ක් හෝ තුනම හෝ තෝරාගත හැකිය.

**6.1.2** පහත දැක්වෙන ආගම් හා ශිෂ්ටාචාර විෂයයන් (6.1.6 හි ආ) අතරින් යම් ආගමක් තෝරා ගන්නේනම්, ඊට අදාළ ශිෂ්ටාචාර විෂයය තෝරාගත නොහැකි ය.

**6.1.3** පහත දැක්වෙන සෞන්දර්ය අධ්‍යයන විෂයයන් (6.1.6 හි ඇ) අතරින් විෂයයක් හෝ දෙකක් හෝ තෝරා ගත හැකිය.

**6.1.4** පහත දැක්වෙන භාෂා විෂයය කාණ්ඩයේ (6.1.6 හි ඇ) දැක්වෙන භාෂා විෂයයන්ගෙන් ඕනෑම භාෂා විෂයයක් හෝ විෂයයන් 2ක් හෝ තෝරා ගත හැකිය. එහෙත් විෂයයන් තුනම භාෂා විෂයයන්ගෙන් තෝරා ගන්නේ නම් පහත සඳහන් ආකාරයටම පමණක් විය යුතුය.

- 6.1.6 (ඇ) (i) හි සඳහන් විෂයයන් 3 ම
- 6.1.6 (ඇ) හි (i) හා (ii) යන උපකාණ්ඩ දෙකෙන්ම ඇතුළත් වන පරිදි විෂයයන් තුනක්

**6.1.5** භාෂා විෂයයන් දෙකක් තෝරා ගන්නා ශිෂ්‍යයකුට ද සිය තුන්වන විෂයය වශයෙන් සමාජයීය විද්‍යා/ ව්‍යවහාරික සමාජ අධ්‍යයන, ආගම් හා ශිෂ්ටාචාර, සෞන්දර්ය අධ්‍යයන යන විෂය කාණ්ඩවලින් කැමැති විෂයයක් තෝරා ගත හැකි ය.

### 6.1.6 කලා විෂය ධාරාව සඳහා විෂයය කාණ්ඩ

**(අ) සමාජයීය විද්‍යා/ ව්‍යවහාරික සමාජ අධ්‍යයන විෂයයන්**

1. ආර්ථික විද්‍යාව
2. භූගෝල විද්‍යාව
3. ඉතිහාසය (ලංකා ඉතිහාසය සමඟ ඉන්දිය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය හෝ ලෝක ඉතිහාසය)
4. ගෘහ ආර්ථික විද්‍යාව
5. දේශපාලන විද්‍යාව
6. තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
7. ගිණුම්කරණය හෝ ව්‍යාපාර සංඛ්‍යානය
8. කෘෂි විද්‍යාව හෝ ගණිතය
9. තාක්ෂණවේදය විෂයයන්ගෙන් එක් විෂයයක්
   (සිවිල් තාක්ෂණවේදය හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය හෝ විදුලිය ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය හෝ ආහාර තාක්ෂණවේදය හෝ කෘෂි තාක්ෂණවේදය හෝ ජෛව සම්පත් තාක්ෂණවේදය)
10. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**(ආ) ආගම් හා ශිෂ්ටාචාර විෂයයන්**

1. බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය
2. ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
3. හින්දු ධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය
4. ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය
5. ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය

**(ඇ) සෞන්දර්ය අධ්‍යයන විෂයයන්**

1. චිත්‍ර කලාව
2. නර්තනය (දේශීය හෝ භරත නාට්‍ය)
3. සංගීතය (පෙරදිග සංගීතය හෝ කර්ණාටක සංගීතය හෝ බටහිර සංගීතය)
4. නාට්‍ය හා රංග කලාව (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි)

**(ඈ) භාෂා විෂයයන්**

I. සිංහල, දෙමළ, ඉංග්‍රීසි
II. අරාබි, පාලි, සංස්කෘත
III. චීන, මැලේ, ප්‍රංශ, ජර්මන්, රුසියන්, හින්දි, ජපන්

### 6.2 වාණිජ්‍ය විෂය ධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂයයන් අතරින් අවම වශයෙන් විෂයයන් දෙකක් තෝරාගත යුතුය.

1. ගිණුම්කරණය
2. ව්‍යාපාර අධ්‍යයනය
3. ආර්ථික විද්‍යාව

ඉතිරි විෂයය පහත දැක්වෙන විෂයන් අතරින් තෝරාගත යුතුය.

1. ව්‍යාපාර සංඛ්‍යානය
2. භූගෝල විද්‍යාව
3. දේශපාලන විද්‍යාව
4. ඉතිහාසය (ලංකා ඉතිහාසය සමඟ ඉන්දිය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය හෝ ලෝක ඉතිහාසය)
5. තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
6. ඉංග්‍රීසි
7. ජර්මන්
8. ප්‍රංශ
9. කෘෂි විද්‍යාව
10. සංයුක්ත ගණිතය
11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**6.3** **ජෛවීය විද්‍යා විෂය ධාරාව**

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් 03 ක් තෝරා ගත යුතුය.

1. ජීව විද්‍යාව
2. රසායන විද්‍යාව
3. භෞතික විද්‍යාව
4. කෘෂි විද්‍යාව
5. ගණිතය

**6.4** **භෞතීය විද්‍යා විෂය ධාරාව**

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනක් තෝරා ගත යුතුය.

1. සංයුක්ත ගණිතය
2. රසායන විද්‍යාව
3. භෞතික විද්‍යාව
4. උසස් ගණිතය

**7.0** ඉහත සඳහන් පරිදි විෂය ධාරාවන් යටතේ අදාළ විෂයය සංයෝජනයන් තෝරා ගත යුතුය. එහෙත් අදාළ පාසලේ ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටී නම් හා කාලසටහන් ලබාදීමටත්, පහසුකම් සැපයීමටත් හැකියාව ඇත්නම් පමණක් තමන්ට කැමැති විෂයයන් සහිත විෂයය සංයෝජනයක් තෝරා ගැනීමේ ඉඩකඩ සිසුනට ලබාදිය හැකි ය. එසේ වුවද විෂයයන් අතරින් "හෝ" යනුවෙන් සඳහන් කර ඇත්නම් ඉන් එක් විෂයයක් පමණක් තෝරාගත යුතුය යන කොන්දේසියට යටත්ව තෝරා ගැනීම් සිදු කළ යුතුය.

**8.0** එකකට වැඩි විෂය ධාරාවන් යටතේ විෂයයන් තෝරා ගත් අවස්ථාවේ දී විභාග ප්‍රතිඵල ලබා දෙනුයේ "පොදු විෂය ධාරාව" යනුවෙන් හඳුන්වන විශේෂ විෂය ධාරාවක් යටතේ ය.

## 9.0 විශ්ව විද්‍යාල උපාධි පාඨමාලාවන් සඳහා විෂයය සංයෝජන

**9.1** විශ්ව විද්‍යාල මගින් පවත්වනු ලබන ප්‍රථම උපාධි පාඨමාලාවන්ට ඇතුළත්වීම සඳහා ශිෂ්‍යයන් විසින් අ.පො.ස. (උසස් පෙළ) දී හදාරා තිබිය යුතු විෂයය සංයෝජන පහත දැක්වේ. විශ්ව විද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලාවන් සඳහා මූලික සුදුසුකම් වශයෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අදාළ ප්‍රධාන විෂයයන් තුනෙන්ම සමත් වී තිබිය යුතු අතර, සාමාන්‍ය පොදු පරීක්ෂණයක දී අවශ්‍ය වන ලකුණු ප්‍රමාණය ලබා තිබීම අත්‍යාවශ්‍යය වේ. එහෙත් විශ්ව විද්‍යාලයට බඳවා ගන්නා පදනම හා ඇතුළත් කර ගත හැකි සංඛ්‍යාව අනුව මූලික සුදුසුකම් ලබාගත් අය අතරින් තෝරා ගැනීමේ කටයුතු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකරනු ඇත.

**9.2** පහත සඳහන් කරනුයේ විශ්ව විද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නියම කර ඇති අ.පො.ස. (උසස් පෙළ) විෂය සංයෝජන පමණි. ඊට අදාළ වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් ඒ ඒ අධ්‍යයන වර්ෂය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත් කරන " ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය" නම් අත්පොත පරිශීලනය කළ යුතුය.

**1)** **කලා** (ARTS)

කලා විෂයය ධාරාව යටතේ දී ඇති කොන්දේසිවලට අනුව තෝරාගත් විෂයයන් 03 ක්

**2)** **කලා** (SP) – (ARTS – SP)

කලා විෂය ධාරාව යටතේ දී ඇති කොන්දේසිවලට අනුව තෝරා ගත් විෂයයන් 03 ක්, එහි දී

- භාෂා විෂයයන් දෙකකට වඩා පෙනී නොසිටිය යුතුය.
- පහත සඳහන් විෂයයන්ගෙන් එකකට වඩා පෙනී නොසිටිය යුතු ය.

| | |
|---|---|
| ගිණුම්කරණය | ව්‍යාපාර සංඛ්‍යානය |
| ව්‍යාපාර අධ්‍යනය | ආර්ථික විද්‍යාව |

( අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් තිබිය යුතුය.)

3) **කලා (SAB) – (ARTS – SAB)**

කලා, වාණිජ්‍යය යන කුමන හෝ විෂය ධාරාවක් යටතේ තෝරා ගත් විෂයයන් 03 ක්

4) **ජනසන්නිවේදන අධ්‍යයන (COMMUNICATION STUDIES)**

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහිතව ඕනෑම විෂයයන් 03 ක්

(අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් තිබිය යුතුය.)

5) **සාමය හා ගැටුම් නිරාකරණය (PEACE & CONFLICT RESOLUTION)**

අනුමත ඕනෑම විෂයයන් තුනක්

6) **ඉස්ලාම් අධ්‍යයනය (ISLAMIC STUDIES)**

අවම වශයෙන් ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය හෝ විෂයය සමග වෙනත් ඕනෑම විෂයයන් දෙකක්.

7) **අරාබි භාෂාව (ARABIC LANGUAGE)**

අරාබි භාෂාව ද සමග වෙනත් ඕනෑම විෂයයන් දෙකක්

8) **සංගීතය / නැටුම්/ චිත්‍ර හා නිර්මාණ/ නාට්‍ය හා රංග කලා / දෘශ්‍ය හා තාක්ෂණික කලා/ චිත්‍ර හා මූර්ති කලා**
**(MUSIC/ DANCE / ART & DESING / DRAMA & THEATRE/ VISUAL & TECHNOLOGICAL ARTS/ ART & SCULPTURE)**

ඉහත පාඨමාලාවන් හැදෑරීමට බලාපොරොත්තු වන්නේ නම් හැදෑරීමට අපේක්ෂිත පාඨමාලාවට අදාළ විෂයය (සංගීතය/ නැටුම්/ චිත්‍ර/ නාට්‍ය හා රංග කලාව) සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහ අනිකුත් ඕනෑම විෂයයන් දෙකක්

9) **කළමණාකරණය / රාජ්‍ය කළමනාකරණය (විශේෂ) / දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය / වාණිජ්‍යය**
**(MANAGEMENT / PUBLIC MANAGEMENT (SPECIAL)/ ESTATE MANAGEMENT & VALUATION / COMMERCE)**

ඉහත පාඨමාලා සඳහා පහත සඳහන් විෂය සංයෝජන අතුරින් එක් විෂය සංයෝජනයක්

i. ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව හා ගිණුම්කරණය

හෝ

ii. අවම වශයෙන් ඉහත (i) හි සඳහන් විෂයයන් දෙකක් සහ පහත සඳහන් විෂයයන් අතරින් තෝරාගත් එක් විෂයයක්

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව | භූගෝල විද්‍යාව | ඉංග්‍රීසි |
| ජර්මන් | සංයුක්ත ගණිතය | ප්‍රංශ |
| දේශපාලන විද්‍යාව | භෞතික විද්‍යාව | |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | ව්‍යාපාර සංඛ්‍යානය | |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | ඉතිහාසය | |

10) **කළමනාකරණ අධ්‍යයන (TV) – (MANAGEMENT STUDIES –TV)**

ඕනෑම විෂය ධාරාවක් යටතේ ඕනෑම විෂයයන් තුනක්

11) **ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BUSINESS INFORMATION SYSTEMS) (SPECIAL)**

පහත සඳහන් විෂයයන් අතුරින් තුනක්

| | |
|---|---|
| ගිණුම්කරණය | ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර අධ්‍යයනය | ව්‍යාපාර සංඛ්‍යානය |

12) **වෛද්‍ය විද්‍යාව / දන්ත ශල්‍ය විද්‍යාව / පශු වෛද්‍ය විද්‍යාව**
**(MEDICINE / DENTAL SURGERY / VETERINARY SCIENCE)**

පහත සඳහන් විෂයයන් තුනම

ජීව විද්‍යාව රසායන විද්‍යාව භෞතික විද්‍යාව

13) **කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය**
**(AGRICULTURAL TECHNOLOGY & MANAGEMENT)**

පහත සඳහන් විෂය සංයෝජන අතරින් එක් විෂය සංයෝජනයක්

i. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව
ii. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ ගණිතය, ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
iii. රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හෝ ගණිතය

14) **කෘෂිකර්මය (AGRICULTURE)**

ඉහත සඳහන් කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂයය සංයෝජන (13 ඡේදය බලන්න)

15) **ආහාර විද්‍යාව හා පෝෂණය (FOOD SCIENCE & NUTRITION)**

ඉහත සඳහන් කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂයය සංයෝජන (13 ඡේදය බලන්න)

16) **ආහාර විද්‍යාව හා තාක්ෂණය (FOOD SCIENCE & TECHNOLOGY)**

රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

17) **ආයුර්වේද / යුනානි/ සිද්ධ වෛද්‍ය**
**(AYURVEDA /UNANI/ SIDDHA )**

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනම

18) **ජෛවීය විද්‍යාව (BIOLOGICAL SCIENCE)**

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ පහත දැක්වෙන විෂයයන් අතරින් එක් විෂයයක්

| | |
|---|---|
| කෘෂි විද්‍යාව | ගණිතය හෝ සංයුක්ත ගණිතය |
| උසස් ගණිතය | භෞතික විද්‍යාව |

19) **ව්‍යවහාරික විද්‍යා (ජෛවීය විද්‍යා) (APPLIED SCIENCE – BIOLOGICAL SCIENCE)**

ඉහත සඳහන් ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා දක්වා ඇති විෂය සංයෝජන (18 ඡේදය බලන්න)

20) **සෞඛ්‍ය ප්‍රවර්ධන (HEALTH PROMOTION)**

ඉහත සඳහන් ජෛවීය විද්‍යාව පාඨමාලාව සඳහා දක්වා ඇති විෂය සංයෝජන (18 ඡේදය බලන්න)

21) **හෙද (NURSING)**

ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුනම

( අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්)

22) **ඖෂධ විද්‍යාව (PHARMACY)**

රසායන විද්‍යාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

( අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්)

23) **වෛද්‍ය රසායනාගාර විද්‍යා (MEDICAL LABORATORY SCIENCES)**

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

( අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්)

24) **විකිරණ ශිල්පය** (RADIOGRAPHY)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

( අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්)

25) **භෞත චිකිත්ස** (PHYSIOTHERAPY)

භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්

ජීව විද්‍යාව    සංයුක්ත ගණිතය
උසස් ගණිතය    ගණිතය

( අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්)

26) **අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව** (MOLECULAR BIOLOGY & BIOCHEMISTRY)

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනම

27) **ධීවර සහ සාගර විද්‍යාව** (FISHERIES & MARINE SCIENCE)

අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව පාඨමාලාව සඳහා වූ විෂය සංයෝජනය (26 ඡේදය බලන්න)

28) **පරිසර සංරක්ෂණය හා කළමණාකරණය** (ENVIRONMENT CONSERVATION & MANAGEMENT)

ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව සමග පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්

භෞතික විද්‍යාව    සංයුක්ත ගණිතය
කෘෂි විද්‍යාව    උසස් ගණිතය
ගණිතය

29) **සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව** (ANIMAL SCIENCE & FISHERIES)

පහත සඳහන් විෂය සංයෝජන අතරින් එක් විෂය සංයෝජනයක්

i. රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ භෞතික විද්‍යාව
ii. රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂි විද්‍යාව

30) **ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමණාකරණය** (FOOD PRODUCTION & TECHNOLOGY MANAGEMENT)

කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය පාඨමාලාවට අදාළ විෂයය සංයෝජන (13 ඡේදය බලන්න)

31) **ඉංජිනේරු විද්‍යාව** (ENGINEERING)

පහත දැක්වෙන විෂයයන් තුනම

රසායන විද්‍යාව    සංයුක්ත ගණිතය    භෞතික විද්‍යාව

32) **ඉංජිනේරු විද්‍යාව (EM) - භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව**
**(ENGINEERING) (EM) - EARTH RESOURCES ENGINEERING )**

ඉංජිනේරු විද්‍යාව පාඨමාලාවට අදාළ වූ විෂය සංයෝජනය (31 ඡේදය බලන්න)

33) **ඉංජිනේරු විද්‍යාව (TM) - පේෂකර්ම තාක්ෂණය**
**(ENGINEERING) (TM) - TEXTILE & CLOTHING TECHNOLOGY)**

ඉංජිනේරු විද්‍යාව පාඨමාලාව සඳහා අදාළ විෂය සංයෝජන (31 ඡේදය බලන්න)

34) **භෞතිය විද්‍යාව (PHYSICAL SCIENCE)**

සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය සහ රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව හෝ ඇතුළුව පහත සඳහන් විෂයයන්ගෙන් විෂයයන් තුනක්

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව | සංයුක්ත ගණිතය | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |

35) **පරිගණක විද්‍යාව (COMPUTER SCIENCE)**

පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනක්

| | |
|---|---|
| සංයුක්ත ගණිතය | උසස් ගණිතය |
| භෞතික විද්‍යාව | රසායන විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |

සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකකට අවම වශයෙන් සම්මාන (C) සමාර්ථයක්

36) **තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය**
**(INFORMATION & COMMUNICATION TECHNOLOGY)**

පහත සඳහන් විෂයයන්ගෙන් විෂයයන් තුනක් (අවම වශයෙන් එක් විෂයයකට සම්මාන (C) සමාර්ථයක්)

| | |
|---|---|
| උසස් ගණිතය | භෞතික විද්‍යාව |
| ගණිතය හෝ සංයුක්ත ගණිතය | රසායන විද්‍යාව |
| ගිණුම්කරණය | ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | ජීව විද්‍යාව |
| ව්‍යාපාර අධ්‍යයනය | භූගෝල විද්‍යාව |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | සංස්කෘත |
| සංගීතය (පෙරදිග සංගීතය හෝ කර්ණාටක සංගීතය හෝ බටහිර සංගීතය) | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |

(අ.පො.ස (සා.පෙ) විභාගයේදී ගණිතය හා ඉංග්‍රීසි විෂයයන් සඳහා අවම වශයෙන් සම්මාන (C) සමාර්ථයක්)

37) **ව්‍යවහාරික විද්‍යා (භෞතිය විද්‍යා)**
**(APPLIED SCIENCES – PHYSICAL SCIENCE)**

පහත සඳහන් විෂයයන්ගෙන් තුනක්

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව | සංයුක්ත ගණිතය | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

38) **ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය**
**(TRANSPORT & LOGISTICS MANAGEMENT)**

භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය යන විෂයයන් තුනම

39) **කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය**
**(INDUSTRIAL STATISTICS & MATHEMATICAL FINANCE)**

සංයුක්ත ගණිතය ඇතුළුව පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනක්

| | |
|---|---|
| උසස් ගණිතය | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | රසායන විද්‍යාව |

40) **සංඛ්‍යානය සහ සංකාර්ය පර්යේෂණ**
**(STATISTICS & OPERATIONS RESEARCH)**

සංයුක්ත ගණිතය සමග අනිකුත් ඕනෑම විද්‍යා විෂයයන් දෙකක්

## 41) ආගනණය සහ තොරතුරු පද්ධති (COMPUTING & INFORMATION SYSTEM)

පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනක්

| | |
|---|---|
| සංයුක්ත ගණිතය | භෞතික විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව |

සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකක් සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්

## 42) තොරතුරු තාක්ෂණය / කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (INFORMATION TECNOLOGY – IT) / (MANAGEMENT & INFORMATION TECHNOLOGY – MIT)

පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනක්

| | |
|---|---|
| උසස් ගණිතය | සංයුක්ත ගණිතය |
| ගණිතය | භෞතික විද්‍යාව |

අවම වශයෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක්

## 43) ප්‍රමාණ සමීක්ෂණය (ගොඩනැගිලි ආර්ථික විද්‍යාව) (QUANTITY SURVEYING ( BUILDING ECONOMICS))

පහත සඳහන් විෂයයන් අතරින් අවම වශයෙන් එක් විෂයයක්

සංයුක්ත ගණිතය උසස් ගණිතය

සහ

පහත දැක්වෙන විෂයයන්ගෙන් අනෙකුත් විෂයයක් හෝ විෂයයන් දෙකක්

| | |
|---|---|
| ඉංජිනේරු තාක්ෂණය | ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | ව්‍යාපාර අධ්‍යයනය |
| භෞතික විද්‍යාව | රසායන විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |

ඊට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී

(අ) ගණිතය හා ඉංග්‍රීසි විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්

(ආ) විද්‍යා විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්

## 44) මැනුම් විද්‍යාව (SURVEYING SCIENCE)

භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය සහ වෙනත් ඕනෑම විෂයයක්

## 45) නගර හා ග්‍රාම නිර්මාණය (TOWN & COUNTRY PLANNING)

පහත සඳහන් විෂයයන් අතරින් අවම වශයෙන් විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ඉංජිනේරු තාක්ෂණය | රසායන විද්‍යාව | උසස් ගණිතය |
| කෘෂි විද්‍යාව | සංයුක්ත ගණිතය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ජීව විද්‍යාව | ආර්ථික විද්‍යාව | දේශපාලන විද්‍යාව |
| ව්‍යාපාර අධ්‍යයනය | ගණිතය | භෞතික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | භූගෝල විද්‍යාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |

තෙවන විෂයය පහත සඳහන් විෂයයන්ගෙන් එක් විෂයයක්

| | | |
|---|---|---|
| අරාබි | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | මැලේ |
| චිත්‍ර කලාව | ගෘහ ආර්ථික විද්‍යාව | පාලි |
| බුද්ධ ධර්මය | හින්දි | රුසියන් |
| බෞද්ධ ශිෂ්ටාචාරය | හින්දු ධර්මය | සංස්කෘත |
| ක්‍රිස්තු ධර්මය | හින්දු ශිෂ්ටාචාරය | සිංහල |
| චීන | ඉතිහාසය | දෙමළ |
| ඉංග්‍රීසි | ඉස්ලාම් | ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය |
| ප්‍රංශ | ඉස්ලාම් ශිෂ්ටාචාරය | |
| ජර්මන් | ජපන් | |

( ඊට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් )

46) **නිර්මිත පරිසරය/ වාස්තු විද්‍යාව (ගොඩනැගිලි ආර්ථික විද්‍යාව) / මෝස්තර නිර්මාණ ශිල්පය (වාස්තු විද්‍යාව) (ARCHITECTURE/ BUILT ENVIRONMENT) / DESIN (ARCHITECTURE)**

i. පහත දැක්වෙන විෂයයන් අතරින් අවම වශයෙන් එක් විෂයයක්

| | | |
|---|---|---|
| චිත්‍ර කලාව | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | | |

සහ

ii. පහත දැක්වෙන විෂයයන් අතරින් තවත් එක් විෂයයක් හෝ විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | හින්දි | අරාබි |
| හින්දු ශිෂ්ටාචාරය | බෞද්ධ ශිෂ්ටාචාරය | ඉතිහාසය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ගෘහ ආර්ථික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | චීන | ජපන් |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | ආර්ථික විද්‍යාව |
| දේශපාලන විද්‍යාව | ගණිතය | පාලි |
| ඉංග්‍රීසි | සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ජර්මන් |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | | |

ඊට අමතරව පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරාලිය යුතුය.

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ගණිතය විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්

47) **විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය (FASHION DESIGN & PRODUCT DEVELOPMENT)**

ඕනෑම විෂයධාරා අතරින් ඕනෑම විෂයයන් තුනක්

( අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හා ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් )

48) **නීතිය (LAW)**

i. පහත දැක්වෙන විෂයයන්ගෙන් තෝරාගත් විෂයයන් තුනක්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව | උසස් ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ඉතිහාසය | ව්‍යාපාර අධ්‍යයනය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| ගණිතය හෝ සංයුක්ත ගණිතය | භෞතික විද්‍යාව | |

හෝ

ii. ඉහත සඳහන් විෂයයන්ගෙන් එකක් හෝ දෙකක් හෝ සමඟ පහත දැක්වෙන විෂයයන්ගෙන් ඉතිරි විෂයය හෝ විෂයයන්

| | |
|---|---|
| බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය | හින්දු ධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය |
| ක්‍රිස්තු ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය |
| ජපන් | චීන |
| පාලි | ඉංග්‍රීසි |
| සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | ජර්මන් |
| දෙමළ | අරාබි |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | |

( අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් )

**49) පහසුකම් කළමනාකරණය (FACILITIES MANAGEMENT)**

සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය සමග පහත සඳහන් විෂයයන්ගෙන් ඕනෑම විෂයයන් දෙකක්

| | | |
|---|---|---|
| ව්‍යාපාර සංඛ්‍යානය | භෞතික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

ඊට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී
(අ) ඉංග්‍රීසි හා ගණිතය විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ්‍යය
(ආ) විද්‍යාව විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය

**50) පරිගණනය සහ කළමනාකරණය (COMPUTATION &MANAGEMENT)**

ආර්ථික විද්‍යාව හෝ සංයුක්ත ගණිතය හෝ ඇතුළුව ඕනෑම විෂයයන් තුනක්

( ඊට අමතරව අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ්‍යයක් )

**51) කළමණාකරණය සහ තොරතුරු තාක්ෂණය (SEUSL) – MANAGEMENT & INFORMATION TECHNOLOGY (SEUSL)**

ඕනෑම විෂයය ධාරාවකින් ඕනෑම විෂයයන් තුනක්

**52) විද්‍යාව සහ තාක්ෂණය (SCIENCE & TECHNOLOGY)**

ජෛවීය විද්‍යා සහ භෞතීය විද්‍යා පාඨමාලා සඳහා අවශ්‍ය විෂයයන් තුනක් (18 සහ 34 ඡේද බලන්න)

**53) පරිගණක විද්‍යාව සහ තාක්ෂණය (COMPUTER SCIENCE & TECHNOLOGY)**

මෙම පාඨමාලාව සඳහා ද ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා සහ ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යා) පාඨමාලා සඳහා අවශ්‍ය විෂයයන් තුනක් (18, 34 සහ 37 ඡේද බලන්න).

**54) ව්‍යවසායකත්වය සහ කළමනාකරණය (ENTREPRENEURSHIP & MANAGEMENT)**

ඕනෑම විෂයය ධාරාවකින් ඕනෑම විෂයයන් තුනක්

**55) සත්ත්ව පාලන විද්‍යාව (ANIMAL SCIENCE)**

ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් අදාළ වේ (18 ඡේදය බලන්න)

**56) අපනයන කෘෂිකර්මය (EXPORT AGRICULTURE)**

ජෛවීය විද්‍යා පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් අදාළ වේ (18 ඡේදය බලන්න)

**57) තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම (TEA TECHNOLOGY & VALUE ADDITION)**

පහත සඳහන් එක් විෂයය සංයෝජනයකින් විෂයයන් තුනක්

i. ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව
ii. සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

**58) කාර්මික තොරතුරු තාක්ෂණය (INDUSTRIAL INFORMATION TECHNOLOGY)**

ඕනෑම විෂයය ධාරාවකින් ඕනෑම විෂයයන් තුනක්

**59) ඛණිජ සම්පත් සහ තාක්ෂණය (MINERAL RESOURCES & TECHNOLOGY)**

පහත සඳහන් එක් විෂයය සංයෝජනයක්

i. ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව
ii. සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

**60) ජලජ සම්පත් තාක්ෂණය (AQUATIC RESOURCES TECHNOLOGY)**

ජෛවීය විද්‍යා පාඨමාලාවට අදාළ වන විෂය සංයෝජනය (18 ඡේදය බලන්න)

**61) තාල සහ ක්ෂීර තාක්ෂණය හා අගය වැඩි කිරීම (PLAM & LATEX TECHNOLOGY & VALUE ADDITION)**

පහත සඳහන් එක් විෂයය සංයෝජනයකින් විෂයයන් තුනක්

- i. ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය
- ii. සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව

**62) ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය (HOSPITALITY TOURISUM & EVENTS MANAGEMENT)**

ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් තුනක්

**63) ශාරීරික අධ්‍යාපනය / ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය (PHYSICAL EDUCATION) / (SPORTS SCIENCES & MANAGEMENT)**

පහත සඳහන් විෂයයන් අතරින් ඕනෑම විෂයයන් තුනක්

| | |
|---|---|
| සංයුක්ත ගණිතය | ආර්ථික විද්‍යාව |
| උසස් ගණිතය | භූගෝල විද්‍යාව |
| ගණිතය | ගිණුම්කරණය |
| භෞතික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයනය |
| රසායන විද්‍යාව | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ජීව විද්‍යාව | දේශපාලන විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | ඉතිහාසය |
| කෘෂි විද්‍යාව | |

**64) කථන හා භාෂා චිකිත්සාව (SPEECH & LANGUAGE THEARAPHY)**

ජෛවීය විද්‍යාව, භෞතීය විද්‍යාව හෝ කලා විෂය ධාරාවන් හෝ යටතේ ඕනෑම විෂයයන් තුනක්

මෙම චක්‍රලේඛයේ නියමයන්ට අනුව කටයුතු සිදු කළ යුතු අතර සියුන් දැනුවත් කිරීමට ද පියවර ගනු ඇතැයි අපේක්ෂා කරමි.

එම්.එම්.එන්.ඩී. බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති
4. විභාග කොමසාරිස් ජනරාල්
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
6. විගණකාධිපති
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්
8. රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්

**සටහන්**

1. මෙම චක්‍රලේඛ විධිවිධාන 2009 හා ඉන් පසු 12 ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් සඳහා බලපැවැත් වේ.
2. 2009 ට පෙර එනම් 2008 හා ඊට පෙර 12 ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන් සඳහා පැරණි චක්‍රලේඛය (අංක 98/15) හා ඊට අදාළ සංශෝධන චක්‍රලේඛ විධිවිධාන බලපැවැත් වේ.
3. කෙසේ වුවද පැරණි විෂය නිර්දේශයට අනුව අ.පො.ස. (උසස් පෙළ) විභාග පැවැත්වෙන්නේ 2012 වර්ෂය දක්වා පමණි.
4. නව විෂය නිර්දේශයට අනුව 2008 වර්ෂයේ දී හා ඊට පසු වර්ෂවලදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි/ සිටින සිසුන් අ.පො.ස. (උසස් පෙළ) 12 ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබිය යුතුය.
    - මාධ්‍ය භාෂාව හා ගණිතය ඇතුළුව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටින විෂයයන් 09 න් විෂයන් 06ක් සමත් වී තිබිය යුතු අතර ඉන් අවම වශයෙන් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ්‍ය ලබා තිබිය යුතුය.
    - අ.පො.ස. (උසස් පෙළ) පංතිවලට සිසුන් ඇතුළත් කිරීමේ අනෙකුත් නීතිරීති හා විශේෂ සුදුසුකම් අ.පො.ස (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමට අදාළ චක්‍රලේඛයට අනුව සිදුවිය යුතුය.
5. මෙම නව චක්‍රලේඛයට අනුව අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයන් තුනක් සමග සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂය යන විෂයයන් පහටම පෙනී සිටිය යුතුය.
6. එහෙත් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයෙහි ප්‍රතිඵල උපයෝගී කරගනු නොලැබේ.
7. කලා විෂය ධාරාව යටතේ භාෂා විෂයයන් තුනක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි වශයෙන් තෝරාගත හැකිය. තවද සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා විෂයයක් හෝ විෂයයන් සමග අරාබි. පාලි, සංස්කෘත, යන විෂයයන් හෝ විෂයයක් ඇතුළත්ව විෂයයන් තුනක් තෝරාගත හැකිය.
8. චීන, මැලේ. ප්‍රංශ, ජර්මන්, රුසියන්. හින්දි, ජපන් ආදී භාෂා විෂයයක් ඇතුළත්ව භාෂා විෂයයන් තුනක් තෝරා ගත නොහැකිය.
9. ඕනෑම භාෂා විෂයයන් දෙකක් තෝරා ගත හැකි ය. භාෂා විෂයයන් දෙකක් තෝරාගන්නේ නම් තෙවන විෂය වශයෙන් සමාජීය විද්‍යා/ ව්‍යවහාරික සමාජ අධ්‍යනය, ආගම් හා ශිෂ්ටාචාර, සෞන්දර්ය අධ්‍යනය යන විෂය කාණ්ඩවලින් කැමති විෂයයක් තෝරා ගත හැකිය.
10. ඇතැම් විශ්ව විද්‍යාලවල හි කළමනාකරණ පාඨමාලා සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගිණුම්කරණ විෂය සමත් වී තිබීම බලාපොරොත්තු වේ. එම නිසා විශ්ව විද්‍යාලයේ දී එම පාඨමාලා හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් ගිණුම්කරණය විෂයය තෝරා ගැනීම යෝග්‍ය වේ.
11. විශ්ව විද්‍යාලයන් හි වෛද්‍ය විද්‍යාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් අනිවාර්යයෙන්ම රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් තෝරා ගත යුතු ය.
12. ඉංජිනේරු විද්‍යාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් අනිවාර්යයෙන්ම සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව යන විෂයයන් තෝරා ගත යුතු ය.
13. අ.පො.ස. (උසස් පෙළ) පංතිවල තෝරා ගත් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කළ හැකි ය. ඒ පිළිබඳ විස්තර දැන ගැනීම පිණිස ඊට අදාළ චක්‍රලේඛ පරිශීලනය කළ යුතු ය.